රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 11/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 මාර්තු මස 31 වැනි දින.

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.**

වෛද්‍ය පරීක්ෂණය - ආයතන සංග්‍රහයේ
XXVI වැනි පරිච්ඡේදය

ආයතන සංග්‍රහයේ XXVI වැනි පරිච්ඡේදයේ 4:2 උප වගන්තිය ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරන්න.

"4:2 - කොළඹ, මහනුවර, පේරාදෙණිය, ගාල්ල හෝ යාපනය දිස්ත්‍රික්කයන්හි සේවය කරන නිලධාරියකු සම්බන්ධයෙන් ... මෙම කාර්යය සඳහා, 142 වැනි පොදු ආකෘති පත්‍රයේ පිළියෙල කරන ලද අයදුම්පතක් ඉහත සඳහන් දිස්ත්‍රික්කයන්හි අදාල මහ රෝහල් අධ්‍යක්ෂ (ශික්ෂණ) වෙත ඉදිරිපත් කළ යුතුය. අනෙක් සියළුම අවස්ථාවන්හිදී මෙම ... ඉල්ලුම්පත් අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

මහ රෝහල් අධ්‍යක්ෂ (ශික්ෂණ)/ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් පැවැත්වීමට කටයුතු යොදනු ඇත.

යම් ප්‍රදේශයක වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල නොපැවැත්වේ නම්, අදාල නිලධාරියාව, වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවිය හැකි යාබද හෝ ආසන්නතම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. වෛද්‍ය සහතිකය නිකුත්කරන වෛද්‍ය නිලධාරියෙකු, එම රෝගියා පරීක්ෂාකිරීමේ මණ්ඩලයක සාමාජිකයෙකු ලෙස කටයුතු නොකළ යුතුය."

Siriwardhana

(ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-25